PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2024-09-12

ඊ.එම්.ඩබ් ලලිත් ඒකනායක මහතා
සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

ගරු සභාපතිතුමනි,

**<u>බදුල්ල සහ වව්නියා මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන් මැතිවරණ නීති ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධවයි.</u>**

පොලිස්පතිවරයෙකු හෝ වැඩ බලන පොලිස්පතිවරයකු පත්කර නොමැති පසුබිමකදීත් 2024 ජනාධිපතිවරණ සමය තුළ නීතිය හා සාමය සුරක්ෂිත කිරීම උදෙසා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව ගෙනයන වැඩපිළිවෙළ අප විසින් අගය කරමු.

මැතිවරණ භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ඇතුළු කාර්ය මණ්ඩලය, ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් හා ස්ථානාධිපතිවරුන් බහුතරයක් මැතිවරණ නීති ආරක්ෂා කිරීමට පක්ෂග්‍රාහී ස්වරූපයකින් තොරව කටයුතු කිරීම අපගේ ඇගයීමට ලක්වේ.

එවන් පසුබිමක් තුළ බදුල්ල මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා මැතිවරණ නීති උල්ලංඝණය කළ පිරිසක් අත්අඩංගුවට ගෙන අත්තනෝමතික ලෙස මුදා හැර ඇති බව අපගේ නිරීක්ෂකයන් අප වෙත වාර්තා කර ඇති අතර ඒ සඳහා ප්‍රදේශ භාර ඉහළ පොලිස් නිලධාරීන්ගෙන් උපදෙස් ලබාගෙන ඇති බවද සඳහන්ය. පොලිස් නිලධාරීන් කිහිපදෙනෙකු විසින් සිදුකරන මෙවන් ක්‍රියාකාරකම් පොලිස් දෙපාර්තමේන්තුවේ කීර්ති නාමයට ද ජනාධිපතිවරණයේ නිදහස් හා සාධාරණ භාවයට ද බලපෑමක් එල්ල කරයි.

එමෙන්ම වවුනියාව මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා මැතිවරණ නීතිය නොසලකා හැර ඇති බවත්, නීති විරෝධී පෝස්ටර් කටවුට් ඉවත්කිරීමට උනන්දුවක් නොදක්වන බවත් වාර්තා වන අතර සහකාර මැතිවරණ කොමසාරිස්වරයාගේ උපදෙස් ද නොසලකා හරින බවත් වාර්තා වේ.

ඉහත සිදුවීම් පිළිබඳව සොයාබලා කඩිනමින් ක්‍රියාමාර්ග ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ

පිටපත - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අසංග කරවිට මහතා
සභාපතිතුමා, මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය.
මාධ්‍ය ආයතන හා උනන්දුවක් දක්වන සෙසු පාර්ශව

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com